# කර්මාන්ත අමාත්‍යාංශය

ලංසු අංකය : MI/FIN/32/03/18

## <u>පාවිච්චි කරන ලද වාහන 05ක් විකිණීම සඳහා මිල ගණන් කැඳවීමයි.</u>

01. කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන/ටෙන්ඩර් කමිටු සභාපති විසින්, මෙම අමාත්‍යාංශයේ භාවිතයෙන් ඉවත් කරන ලද වාහන 05ක් විකිණීම සඳහා විවෘත මිළ ගණන් කැඳවනු ලැබේ.

02. පහත සඳහන් පාවිච්චි කරන ලද වාහන 2023/03/07 දින සිට 2023/03/27 දින දක්වා (කාර්යාලීය දිනයන්හිදී) පෙ.ව 10.00 සිට ප.ව 3.00 දක්වා අමාත්‍යාංශ පරිශ්‍රයේදී පරීක්ෂා කිරීමට හැකියාව ඇත.

| අංක | වාහන ලියාපදිංචි අංකය | වර්ගය | ඉන්ධන වර්ගය | නිෂ්පාදිත වර්ෂය |
|---|---|---|---|---|
| 1 | KH-2XXX | ටාටා ඉන්ඩිගෝ කාර් | පෙට්‍රල් | 2006 |
| 2 | KW-8XXX | ලෑන්ඩ් රෝවර් ඩිස්කවරි ජීප් | ඩීසල් | 2013 |
| 3 | KY-3XXX | ලෑන්ඩ් රෝවර් ඩිස්කවරි ජීප් | ඩීසල් | 2014 |
| **අබලි ලෙස අපරහණය කරනු ලබන වාහන** | | | | |
| 4 | 18-2XXX | නිසාන් සනී කාර් | ඩීසල් | 1992 |
| 5 | WC-4XXX | කයිනටික් සෆාරි මෝටර් සයිකල් | පෙට්‍රල් | 2008 |

03. මේ සඳහා ලංසුකරුවන් හට ආපසු නොගෙවන ලංසු ගාස්තුව හා සෑම එක් එක් වාහනයක් සඳහාම ආපසු ගෙවනු ලබන අදාල තැන්පතු ගාස්තුව පහතින් සඳහන් කර ඇති පරිදි 2023/03/07 දින සිට 2023/03/27 දින දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 අතර කාලයේදී අමාත්‍යාංශයේ මුදල් අංශයේ සරප් වෙත ගෙවීම් කර අදාල රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රසම්පාදන අංශයෙන් ලංසු ලේඛන ලබාගත හැකිය. එසේම ආපසු ගෙවනු ලබන තැන්පතු ගාස්තුව අදාල පරිදි ගෙවීම් කර ඒ සඳහා වන රිසිට්පතෙහි පිටපතක් (පොදු 172) සමඟ මිල ගණන් ඉදිරිපත් කළ යුතුවේ.

| අනු අංකය | විස්තරය | ලංසු ලේඛන සඳහා ආපසු නොගෙවනු ලබන ගාස්තුව රු. | ආපසු ගෙවනු ලබන ලංසු තැන්පතු ගාස්තුව (එක් වාහනයක් සඳහා) රු. |
|---|---|---|---|
| 01 | අපහරනය කරනු ලබන වාහන | 2,000.00 | 30,000.00 |
| 02 | අබලි ලෙස අපහරනය කරනු ලබන වාහන | 1,000.00 | 1,500.00 |

*සටහන - අපහරනය කරනු ලබන වාහන සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට එක් ලංසු ලේඛනයක් ද අබලි ලෙස අපහරනය කරනු ලබන වාහන සඳහා එක් ලංසු ලේඛනයකුත් වශයෙන් වෙන වෙනම ලංසු ලේඛන මිලදී ගත යුතු වේ.*

04. සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු ලේඛන 2023/03/28 දින පෙ.ව.10.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 03, ගාලු පාරේ, අංක 73/1 හි පිහිටි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම සිදු කළ යුතු අතර, ලංසු එදිනම පෙ.ව.10.00 ට අමාත්‍යාංශ පරිශ්‍රයේදී විවෘත කරනු ලැබේ. ලංසුකරුට හෝ ඔවුන්ගේ නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

05. අපහරණය කරන වාහන අමාත්‍යාංශ පරිශ්‍රයේ සිට ප්‍රවාහනය කිරීමට වැය වන ගාස්තු අයදුම්කරුවන් විසින්ම දැරිය යුතු වේ.

06. ඉහතින් සඳහන් කර ඇති වාහන අපහරණය කිරීමෙන් පසුව අමාත්‍යාංශය විසින් එම වාහන සම්බන්ධයෙන් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

07. වැඩිදුර තොරතුරු පහත දුරකතන අංකයෙන් ලබා ගත හැකිය.

ප්‍රධාන ගණකාධිකාරී : 011-2327053 හෝ 0711965912

සභාපති
අමාත්‍යාංශ ප්‍රසම්පාදන/ටෙන්ඩර් කමිටුව (MPC)
කර්මාන්ත අමාත්‍යාංශය,
නො.73/1, ගාලු පාර,
කොළඹ 03.